තේ ශක්ති අරමුදල - 2017
----

1. මූල්‍ය ප්‍රකාශන

1.1 වියාචනය කළ මතය

තේ ශක්ති අරමුදලේ 2017 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ විස්තීරණ ආදායම් ප්‍රකාශනය, හිමිකම් වෙනස්වීමේ ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා මුදල් ප්‍රවාහ ප්‍රකාශනය සහ මූල්‍ය ප්‍රකාශන වලට අදාළ සටහන්, සාරාංශගත වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්තිවලින් සමන්විත 2017 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන, ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ ,2000 අංක 47 දරන තේ ශක්ති අරමුදල් පනතේ සහ 1971 අංක 38 දරන මුදල් පනතේ විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ.

අරමුදලේ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මම මතයක් ප්‍රකාශ නොකරමි. මෙම වාර්තාවේ 1.5 ඡේදයේ දක්වා ඇති කරුණුවල වැදගත්කම හේතුවෙන් මෙම මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් විගණන මතයක් සඳහා පදනමක් සැපයීමට ප්‍රමාණවත් හා උචිත විගණන සාක්ෂි ලබාගැනීමට මා හට නොහැකි විය.

1.2 වියාචනය කළ මතය සඳහා පදනම

මෙම වාර්තාවේ 1.5 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මා මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් වියාචනය කළ මතයක් පළකරනු ලැබේ.

1.3 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ සහ ඊට සම්බන්ධ පාලනය කරන පාශර්වයන්ගේ වගකීම

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍ය වන අභ්‍යන්තර පාලනයන් තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේදී, අරමුදල අඛණ්ඩව පවත්වාගෙන යාමේ හැකියාව තීරණය කිරීම කළමනාකරණයේ වගකීමක් වන අතර, කළමනාකාරීත්වය අරමුදල ඈවර කිරීමට අදහස් කරන්නේ නම් හෝ වෙනත් විකල්පයක් නොමැති විටදී මෙහෙයුම් නැවැත්වීමට කටයුතු කරන්නේ නම් හැර අඛණ්ඩ පැවැත්මේ පදනම මත ගිණුම් තැබීම හා අරමුදල අඛණ්ඩ පැවැත්මට අදාළ කරුණු අනාවරණය කිරීමද කළමනාකරණයේ වගකීමකි.

අරමුදලේ මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය සම්බන්ධව පරික්ෂා කිරීමේ වගකීම, සම්බන්ධ පාර්ශව විසින් දරනු ලබයි.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) උප වගන්තිය ප්‍රකාරව, අරමුදලේ වාර්ෂික සහ කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වාගෙන යා යුතුය.

1.4 මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම

සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා සහ වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණන වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සෑමවිටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් අනාවරණය කරගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවිය හැකි අතර, එහි ප්‍රමාණාත්මක භාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කරගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ක්‍රියා කරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවීමේ අවදානම් හඳුනාගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලැසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන්නේ ඒවා දුස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන්, චේතනාන්විත මගහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මග හැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.

- අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවුවද, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබාගන්නා ලදී.

- භාවිතා කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය, ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය සහ කළමනාකරණය විසින් කරන ලද සම්බන්ධිත හෙළිදරව් කිරීම් අගයන ලදී.

- සිද්ධීන් හෝ තත්ත්වයන් හේතුවෙන් අරමුදලේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ ප්‍රමාණාත්මක අවිනිශ්චිතතාවයක් තිබේද යන්න සම්බන්ධයෙන් ලබාගත් විගණන සාක්ෂි මත පදනම්ව ගිණුම්කරණය සඳහා ආයතනයේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ පදනම යොදා ගැනීමේ අදාලත්වය තීරණය කරන ලදී. ප්‍රමාණවත් අවිනිශ්චිතතාවයක් ඇති බවට මා නිගමනය කරන්නේ නම් මූල්‍ය ප්‍රකාශනවල ඒ සම්බන්ධයෙන් වූ හෙළිදරව්කිරීම් වලට මාගේ විගණන වාර්තාවේ අවධානය යොමු කළ යුතු අතර, එම හෙළිදරව්කිරීම් ප්‍රමාණවත් නොවන්නේ නම් මාගේ මතය විකරණය කළ යුතුය. කෙසේ වුවද, අනාගත සිද්ධීන් හෝ තත්ත්වයන් මත අඛණ්ඩ පැවැත්ම අවසන් වීමට හැකිය.

- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුලත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත් කිරීම අගයන ලදී.

හැකිතාක් දුරට හා අවශ්‍ය ඕනෑම විටෙක පහත සඳහන් දෑ පරීක්ෂා කිරීම සඳහා විගණන විෂය පථයද පුළුල් කර ඇත.

- තොරතුරු ඉදිරිපත් කිරීම සම්බන්ධයෙන් බලන කළ අරමුදලේ කාර්යයන් අඛණ්ඩව ඇගයීමට හැකිවන පරිදි එහි සංවිධානය, පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි විධිමත්ව හා ප්‍රමාණාත්මකව සැලසුම් කර තිබේද යන බව සහ එකී පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි ඵලදායී ලෙස පවත්වාගෙන යනු ලැබේ ද යන බව;
- යම් අදාළ ලිඛිත නීතියකට හෝ අරමුදලේ පාලක මණ්ඩලය විසින් නිකුත් කරන ලද වෙනත් පොදු හෝ විශේෂ විධානයකට අනුකූලව, අරමුදල ක්‍රියා කර ඇති බව,
- සිය බලතල, කර්තව්‍ය සහ කාර්යයන්ට අනුකූලව කටයුතු කර ඇති බව,සම්පත් සකසුරුවම් ලෙස, කාර්යක්ෂම ලෙස සහ ඵලදායී ලෙස කාලසීමාවන් තුළ සහ අදාළ නිතීරීතිවලට අනුකූලව ප්‍රසම්පාදනය කර භාවිතා කර ඇති බව,

1.5 මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම සම්බන්ධයෙන් වූ විගණන නිරීක්ෂණ

1.5.1 ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූල නොවීම

	අදාළ ප්‍රමිතියට යොමුව සහිතව අනුකූල නොවීම	කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම	නිර්දේශය
(අ)	තේ ශක්ති අරමුදල වෙත 1998 වර්ෂයේ සිට 2004 වර්ෂය දක්වා තේ කර්මාන්තශාලා ආරම්භ කිරීමට රු.437,505,030 ක භාණ්ඩාගාර ප්‍රදාන ලැබී තිබුණද එම ප්‍රදාන ස්ථාවර වත්කම් සහ මෙහෙයුම් වියදම් සඳහා උපයෝගී වූ ආකාරය පිළිබඳව නිශ්චිතව හඳුනාගැනීමකින් තොරව හා ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිති 20 හි 12 ඡේදයට අනුකූල නොවන පරිදි 2012 වර්ෂයේ සිට වසර 10 කින් ක්‍රමක්ෂය කිරීමේ පදනම මත වර්ෂයකට රු.43,750,503 ක් බැගින් ක්‍රමක්ෂය කර ගිණුම් තැබීම සිදුකර තිබුණු අතර භාණ්ඩාගාර ප්‍රදාන කුමන වත්කම් මිලදී ගැනීමට/ඉදිකිරීමට/නවීකරණය කිරීමට යොදා ගත්තාද, එම වත්කම් වටිනාකම සහ කුමන වර්ෂයේ සිට ක්ෂය කළාද යන්න පිළිබඳ සාක්ෂිද විගණනයට ඉදිරිපත් නොවිය.	තේ ශක්ති අරමුදලේ වත්කම් මිලදී ගැනීම් හා ඉදි කිරීම් කටයුතු 2000, 2001 හා 2002 වර්ෂවල සිදු කර ඇති අතර, මහාභාණ්ඩාගාර මඟින් ලබාදී ඇති රු.මිලියන 437.5ප්‍රතිපාදන කුමන වත්කම මිලදී ගැනීමට/ඉදි කිරීමට හෝ නවීකරණය කිරීමට භාවිතා කලේද යන්න වාර්තා මේවනවිට තේ ශක්ති අරමුදල සතුව නොමැත.	භාණ්ඩාගාර ප්‍රදාන ස්ථාවර වත්කම් සහ මෙහෙයුම් වියදම් උපයෝගී වූ ආකාරය පිළිබඳව නිශ්චිතව හඳුනාගෙන වත්කම් ලේඛනගතකර ගිණුම් තැබීම කර ක්‍රමක්ෂය කල යුතුය.
(ආ)	යථෝක්ත ප්‍රමිතියේ ප්‍රතිපාදන අනුව ක්ෂය අනුපාතයට අනුකූල නොවන පරිදි ක්‍රමක්ෂය ගැලපීම සිදුවුවද ඒ සම්බන්ධයෙන් සමාලෝචිත වර්ෂයේ ගිණුම් තුළ හෙළිදරව් කිරීමක් හෝ කර නොතිබුණි. ඒ අනුව වර්ෂයට අදාළව මූල්‍ය ප්‍රකාශන තුළ විලම්භිත ආදායම ලෙස හඳුනාගෙන ඇති රු. 43,750,503 ක වටිනාකමෙහි නිවැරදිතාවය පිළිබඳව විගණනයේදී තහවුරු කර ගැනීමට නොහැකි විය.	2018 වර්ෂයේ අවසාන ගිණුම් වාර්තා මඟින් අදාල නිවැරදි කිරීම් සිදු කිරීමට කටයුතු කරනු ඇත.	ක්‍රමක්ෂය ගැලපීම සම්බන්ධයෙන් ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිත ප්‍රකාරව මූල්‍ය ප්‍රකාශන තුළ හෙළිදරව් කළ යුතුය.
(ඇ)	ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිති 38 හි 97 ඡේදය හා ගිණුම්කරණ සටහන් අංක 2.5 ප්‍රකාරව අස්පෘශ්‍ය වත්කම් පාවිච්චි කිරීම සඳහා සූදානම් තත්ත්වයට පත්වූ පසු එම අස්පෘශ්‍ය වත්කම් ක්‍රමක්ෂය කිරීම ආරම්භ කළ යුතු වුවද 2010 වර්ෂයේදී රු.2,600,000 කට මිලදීගෙන තිබූ පරිසනක හා මෘදුකාංගය ස්ථාපිත කර සමාලෝචිත වර්ෂය අවසන් දිනට වසර 7 ක් ගත වී තිබුණද මේ දක්වා ක්‍රමක්ෂය කිරීම සිදුකර නොතිබුණි.	අදාල මෘදුකාංගය සියළු කම්හල් ඒකාබද්ධව ක්‍රියාත්මක කිරීම සඳහා නිර්මාණය කර ඇති නමුත් ඇතැම් කර්මාන්තශාලා එකට ජාලගත කර ගැනීමට නොහැකිවීම මත භාවිතා කිරීමට නොහැකිවී ඇත. තේ ශක්ති අරමුදල ප්‍රතිව්‍යුහගත වැඩසටහන යටතේ වැවිලි කර්මාන්ත අමාත්‍යාංශය වෙත පවරන අවස්ථාවේදී අදාල මෘදුකාංගය භෞතිකව භාරදී නොමැති අතර මේ පිළිබඳව තවදුරටත් වැඩිදුර අධ්‍යයනය කර ඉදිරියේදී තීරණයක් ගැනීමට නියමිතව ඇත.	පරිසනක හා මෘදුකාංගය ස්ථාපිත කර ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිත ප්‍රකාරව ක්‍රමක්ෂය කළ යුතුය.

1.5.2 ගිණුම්කරණ අඩුපාඩු

	විගණන නිරීක්ෂණය	කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම	නිර්දේශය
(අ)	2012,2013 හා 2014 වර්ෂයන්හි වගාකරනලද එකතුව වූ රු.5,125,702 ක පරිණත තේ පැළ සමාලෝචිත වර්ෂය අවසානයට පරිණත නොවූ තේ පැළ වශයෙන් ගිණුම්ගත කිරීම හේතුවෙන් අරමුදලේ පරිණත තේ වගාවේ වටිනාකම රු.5,125,702 කින් හා ක්‍රමක්ෂය වටිනාකමද අඩුවෙන් ගිණුම්ගත කර තිබුණි.	2018 වර්ෂයේ අවසාන ගිණුම් වාර්තා මඟින් අදාල නිවැරදි කිරීම් සිදු කිරීමට කටයුතු කරනු ඇත.	තේ පැළ පරිණතභාවයට පත්වීම හඳුනාගත හැකි පරිදි ලේඛන පවත්වා ඒ අනුව වත්කම් හඳුනාගෙන අදාළ ගිණුම්කරණ ගැලපීම් කළ යුතුය.
(ආ)	2008/2009 තක්සේරු වර්ෂය සඳහා ගෙවූ රු.2,790,822 ක ආර්ථික සේවා ගාස්තු, ආදායම් බද්දට හිලව් කළ හැකි වර්ෂ 03ක කාලය ඉක්මවා ගියද සමාලෝචිත වර්ෂය අවසානයේදී ද එම අගය ලියාහැරීමට කටයුතු නොකර ලැබිය යුතු ශේෂයක් ලෙස ගිණුම්ගතකර තිබුණි.	දේශීය ආදායම් දෙපාර්තමේන්තුවේ උපදෙස් ලබාගෙන 2018 වර්ෂයේ ගිණුම් වාර්තාව මඟින් අදාල ගැලපීම් සිදු කිරීමට අවශ්‍ය කටයුතු කරනු ඇත.	ආර්ථික සේවා ගාස්තු ආදායම් නිවැරදි ලෙස හඳුනාගෙන ගිණුම් ගැලපීම් කළ යුතුය.
(ඇ)	2008 වර්ෂයට පෙර දී මෙම අරමුදල සතුවූ කර්මාන්තශාලා සඳහා අරමුදල මඟින් පාලනය වන සුභසාධන රක්ෂණ අරමුදලින් ණය ලබාදී තිබුණද එම ණය ගිණුම්ගත නොකර ණය සඳහා ලැබිය යුතු හා ගෙවිය යුතු රු.61,143,439 ක පොළිය පමණක් සමාලෝචිත වර්ෂයේ ජංගම වත්කම් හා ජංගම වගකීම් ලෙස ගිණුම් ගතකර තිබුණි. අරමුදල මඟින් ලබාදුන් ණය හා පොළිය පිළිබඳ විස්තරාත්මක තොරතුරු ද විගණනය වෙත ඉදිරිපත් කර නොතිබුණි.	ඉදිරි අවසාන ගිණුම් වාර්තාවල අවශ්‍ය නිවැරදි කිරීම සිදු කිරීමට කටයුතු කරනු ඇත.	අරමුදල මඟින් ලබා දී ඇති ණය ගිණුම් ගත කළ යුතුය.
(ඈ)	අරමුදලේ වත්කම් සම්බන්ධයෙන් යාවත්කාලීන කරන ලද ස්ථාවර වත්කම් ලේඛනයක් විගණනය වෙත ඉදිරිපත් කර නොතිබුණු බැවින් ජංගම නොවන වත්කම් හී ඇතුළත් රු.259,889,359 ක් වටිනා දේපල,පිරියත හා උපකරණ සහ එහි ක්ෂය වියදම සම්බන්ධයෙන් විගණනයට තහවුරු කරගත නොහැකි විය.	නිරීක්ෂණය සමඟ එකඟ වේ.	ස්ථාවර වත්කම් ලේඛනයක් පවත්වා ගත යුතුය.
(ඉ)	සමාලෝචිත වර්ෂය අවසානයට වෙළඳ හා වෙනත් ගෙවියයුතු යුතු දැ තුල රු.974,291 ක අවිනිශ්චිත ශේෂයක් ඇතුළත්ව තිබුණි.	නිරීක්ෂණය සමඟ එකඟ වේ.	අවිනිශ්චිත ශේෂය හඳුනාගෙන ගිණුම් ගත කල යුතුය.
(ඊ)	අරමුදල සතුවූ දේශීය තේ අලෙවිසැළට අදාළව රු.448,909 ක බැංකු අයිරාවක් වර්ෂ පහකට වැඩි කාලයක සිට ජංගම වගකීම් ලෙස මූල්‍ය ප්‍රකාශන තුළ දැක්වුවද ලෙජරයේ හා බැංකු	තේ ශක්ති අරමුදල අමාත්‍යාංශය වෙත පවරා ගැනීමෙන් අනතුරුව අදාල නිවැරදි කිරීම සිදු කිරීමට කටයුතු ආරම්භ කර ඇතත් පැවති	ශේෂපත්‍ර දිනට සත්‍ය බැංකු අයිරා ශේෂය හඳුනාගෙන නිරවුල් කිරීමට කටයුතු කල යුතුය.

	ප්‍රකාශන තුළ එම වටිනාකම ඇතුළත් වී නොතිබුණි.	තොරතුරු ප්‍රමාණවත් නොවීම මත එය සිදු කිරීමට නොහැකි වී ඇත.	
(උ)	අරමුදල සතු නොවූ වාහන 37 ක් 2016 වර්ෂය දක්වා අරමුදලේ ස්ථාවර වත්කම් ලේඛණයට ඇතුළත් කර 2005 වර්ෂයේ සිට 2016 වර්ෂය දක්වා රු.20,441,551 ක් ක්ෂය වෙන්කිරීම් ලෙස ගිණුම්ගත කර තිබුණු බැවින් රඳවාගත් ඉපයුම් වල හර ශේෂය රු.20,441,551 කින් අධිගණනය වී තිබුණි.	2018 වර්ෂයේ ගිණුම් වාර්තා මඟින් නිවැරදි කිරීමට අවශ්‍ය කටයුතු කටයුතු කරනු ඇත.	අරමුදල සතු නොවූ වාහන හා එම වත්කම් වල ක්ෂය ලේඛන වලින් ඉවත් කළ යුතුය.
(ඌ)	සමාලෝචිත වර්ෂය අවසානයට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනයේ ජංගම වත්කම් යටතේ දක්වා තිබුණු රු.7,902,517 ක හිඟ තේ තොගය සඳහා වගකිව යුතු නිලධාරීන්ගෙන් අලාභ අයකර ගැනීමට හෝ මූල්‍ය කාර්ය සාධන ප්‍රකාශනයේ අවශ්‍ය ගැලපීම් කිරීමට අරමුදල විසින් කටයුතුකර නොතිබුණි.	නිරීක්ෂණය සමඟ එකඟ වේ.	2020 අගෝස්තු 28 දිනැති රාජ්‍ය මුදල් චක්‍රෙල්බ 01/2020 හි 2.2.3 ප්‍රකාරව හිඟ තේ තොග සම්බන්ධයෙන් කටයුතු කළ යුතුය.
(එ)	කුඩා තේ වතු සංවර්ධන අධිකාරිය හා තේ ශක්ති අරමුදල මැදිහත් වීමෙන් කුඩා තේ වතු සමිති වෙත කල්බදු ක්‍රමයට ලබාගෙන තිබුණු වාහන 13 ක් සඳහා කල්බදු වාරික ලෙස 2001 හා 2002 වර්ෂවලදී රු.2,691,326 ක් තේ ශක්ති අරමුදල විසින් ගෙවීම් කර තිබූ අතර එය ලැබිය යුතු ශේෂයක් ලෙස වසර 15 කට වැඩි කාලයක සිට මූල්‍ය ප්‍රකාශන වල ඉදිරියට ගෙන එමින් පැවතුණු අතර අයකර ගැනීමේ හැකියාව පිළිබඳ ඇගයීමක් කර අදාළ ප්‍රතිපාදනයන් සිදුකර නොතිබුණි.	අදාල ශේෂයන් සම්බන්ධව තවදුරටත් තහවුරු කරගැනීමෙන් අනතුරුව ඉදිරියේදී තීරණයක් ගැනීම සඳහා අවශ්‍ය මූලික කටයුතු සිදු කරමින් පවතී.	විධිමත් පරීක්ෂණයක් සිදු කර කල්බදු වාරික මුදල් අයකර ගැනීමට කටයුතු කළ යුතුය.
(ඒ)	2006, 2007 කාලපරිච්ඡේදයන්හි තේ විකිණීමෙන් පෞද්ගලික සමාගමකින් අයවියයුතු රු.19,744,732 ක මුදල සමාලෝචිත වර්ෂය අවසාන වන විටත් අයකරගෙන නොතිබුණු අතර වසර 10ක් ඉක්මවූ මෙම ලැබියයුතු ශේෂ සඳහා ලබා ගැනීමේ හැකියාව පිළිබඳව තහවුරු කරගැනීමෙන් පසු අදාළ ප්‍රතිපාදනයන් සිදුකර නොතිබුණි. .	අදාල සමාගමට එරෙහිව තේ ශක්ති අරමුදල මඟින් කොළඹ වාණිජ අධිකරණයේ නඩුවක් ගොනු කර තේ ශක්ති අරමුදලට වාසිදායක තීන්දුවක් ලබා දී ඇත. කෙසේ වෙතත් අදාල සමාගම මඟින් එම තීන්දුව එරෙහිව අභියාචනාධිකරණයේ නඩුවක් ගොනු කර ඇති අතර, එම අභියාචනයට අදාල නඩු තීන්දුව 2025 ජනවාරි මසදී ලබාදීමට නියමිතව ඇත.	ණයගැති ශේෂ අයකරගැනීම කල යුතුය.

1.5.3 විගණනය සඳහා ලිඛිත සාක්ෂි නොවීම

	විෂය	මුදල (රු.)	නොසැපයූ විගණන සාක්ෂි	කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම	නිදෙර්ශය
(අ)	වෙළඳ හා වෙනත් ලැබිය යුතු ශේෂ	280,646,358	ශේෂ සනාථන, විස්තරාත්මක උපලේඛන හා කාල විශ්ලේෂණ	නිරීක්ෂණය සමඟ එකඟ වේ.	විස්තරාත්මක උපලේඛන හා කාල විශ්ලේෂණ ඉදිරිපත් කළ යුතුය.
(ආ)	වෙළඳ හා වෙනත් ගෙවිය යුතු ශේෂ	233,794,136	ශේෂ සනාථන, විස්තරාත්මක උපලේඛන හා කාල විශ්ලේෂණ	නිරීක්ෂණය සමඟ එකඟ වේ.	විස්තරාත්මක උපලේඛන හා කාල විශ්ලේෂණ ඉදිරිපත් කළ යුතුය.

1.6 ලැබිය යුතු සහ ගෙවිය යුතු ගිණුම්

1.6.1 ලැබිය යුතු මුදල්

	විගණන නිරීක්ෂණය	කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම	නිර්දේශය
(අ)	2015 වර්ෂයට පෙර සිට අරමුදලේ දේශීය තේ අලෙවිසල වෙත කර්මාන්තශාලා වෙතින් ලබාදී ඇති නිමි තේ සඳහා ලැබියයුතු රු.23, 523,059ක් වෙළඳ ලැබියයුතු දෑ ලෙස අරමුදලේ ජංගම වත්කම්වල දක්වා තිබූ නමුත් එය අයකර ගැනීමට සමාලෝචිත වර්ෂය අවසානය දක්වා කටයුතු කර නොතිබුණි.	අදාල ශේෂයන් සම්බන්ධව පවතින තොරතුරු අනුව ඉදිරි කටයුතු කිරීම සම්බන්ධව අවශ්‍ය මූලික පියවර ගනිමින් ඇත.	ණයගැති ශේෂයන් නිරවුල් කිරීමට අවශ්‍ය ක්‍රියාමාර්ග ගත යුතුය.
(ආ)	2015 වර්ෂයට පෙර සිට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනයේ වෙළෙඳ හා අනෙකුත් ලැබියයුතු දෑ ලෙස ඇතුළත් අයවිය යුතු රු.97,962,620 මුදල් අයකර ගැනීමට සමාලෝචිත වර්ෂය අවසානය දක්වා කටයුතුකර නොතිබුණි.	නිරීක්ෂණය සමඟ එකඟ වේ.	ලැබිය යුතු ණයගැති ශේෂයන් නිරවුල් කිරීමට අවශ්‍ය ක්‍රියාමාර්ග ගත යුතුය.

1.6.2 ගෙවිය යුතු මුදල්

	විගණන නිරීක්ෂණය	කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම	නිර්දේශය
(අ)	2015 වර්ෂයේ සිට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනයේ රු.2,957,414ක විවිධ ණයහිමි ශේෂයක් පැවතියද එම ණයහිමියන් හඳුනාගෙන නිරවුල් කිරීමට සමාලෝචිත වර්ෂය අවසානය දක්වා කටයුතු කර නොතිබුණි.	නිරීක්ෂණය සමඟ එකඟ වේ.	ණයහිමියන් නිරවුල් කළ යුතුය.

(ආ)	2015 වර්ෂයට පෙර සිට අරමුදලේ දේශීය තේ අලෙවිසල වෙත කර්මාන්තශාලා වෙතින් ලබාදී ඇති නිමි තේ සඳහා රු.11,843,044ක් වෙළඳ ණයහිමි හා අනෙකුත් ගෙවියයුතු දෑ ලෙස අරමුදලේ ජංගම වගකීම්වල දක්වා තිබූ නමුත් ඒවා නිරවුල් කිරීමට සමාලෝචිත වර්ෂය අවසානය දක්වා කටයුතුකර නොතිබුණි.	අදාල ශේෂයන් සම්බන්ධව පවතින තොරතුරු අනුව ඉදිරි කටයුතු කිරීම සම්බන්ධව අවශ්‍ය මූලික පියවර ගනිමින් ඇත.	ණයහිමි ශේෂයන් නිරවුල් කළ යුතුය.
(ඇ)	2015 වර්ෂයේ සිට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනයේ ඇතුළත් වූ පිළිවෙළින් රු.42,975,468 ක හා රු.11,814,857 ක සහනාධාර සහිත/ සහනාධාර රහිත ගෙවියයුතු පොහොර වියදම් හා නියෝජිත ගාස්තු/ටෙන්ඩර් ගාස්තු සමාලෝචිත වර්ෂයේදී ද නිරවුල් නොකර ගෙවියයුතු අනෙකුත් දෑ ලෙස ගිණුම්ගත කර තිබුණි.	නිරීක්ෂණය සමඟ එකඟ වේ.	ණයහිමි ශේෂයන් නිරවුල් කළ යුතුය.

1.7 නීති, රීති, රෙගුලාසි සහ කළමනාකරණ තීරණ ආදියට අනුකූල නොවීම

නීති, රීති, රෙගුලාසි ආදියට යොමුව	**අනුකූල නොවීම**	**කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම**	නිර්දේශය
2003 ජුනි 02 දිනැති අංක පීඊඩී 12 දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛයේ 6.5.1 වගන්තිය	ගිණුම් වර්ෂය අවසන් වී දින 60 ක් ඇතුළත මූල්‍ය ප්‍රකාශන සහ කෙටුම්පත් වාර්ෂික වාර්තාව විගණකාධිපති වෙත ඉදිරිපත් කළයුතු වුවත් 2018 සිට 2023 වර්ෂය දක්වා මූල්‍ය ප්‍රකාශන සහ කෙටුම්පත් වාර්ෂික වාර්තා විගණකාධිපති වෙත ඉදිරිපත් කර නොතිබුණු අතර සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කර තිබුනේද 2024 පෙබරවාරි 27 දින වන අතර 2024 ඔක්තෝම්බර් මාසය වන විටත් 2017 වර්ෂයේ කෙටුම්පත් වාර්ෂික වාර්තාවද විගණකාධිපති වෙත ඉදිරිපත් කර නොතිබුණි.	අදාල තත්ත්වය ඉදිරියේදි නිවැරදි කර ගැනීමට අවශ්‍ය කටයුතු සිදු කර ඇත.	මූල්‍ය ප්‍රකාශන සමඟ කෙටුම්පත් වාර්ෂික වාර්තාව ඉදිරිපත් කළ යුතුය.

2. මූල්‍ය සමාලෝචනය

2.1 මූල්‍ය ප්‍රතිඵල

සමාලෝචිත වර්ෂයේ මෙහෙයුම් ප්‍රතිඵලය රු. 184,465,904 ක අතිරික්තයක් වූ අතර ඊට අනුරූප ඉකුත් වර්ෂයේ ඌනතාවය රු.30,529,438 ක් විය. ඒ අනුව මූල්‍ය ප්‍රතිඵලයෙහි රු.214,995,342 ක වර්ධනයක් නිරීක්ෂණය විය. මෙම වර්ධනයට විකුණුම් පිරිවැය රු.140,001,418 කින් අඩුවීම, පරිපාලන වියදම් හා පොලී වියදම් පිළිවෙලින් රු.144,345,186 කින් හා රු.2,343,609 කින් අඩු වීම සහ පොලී ආදායම් රු.597,967කින් වැඩිවීම ප්‍රධාන වශයෙන් හේතු වී තිබුණි.

3. මෙහෙයුම් සමාලෝචනය

3.1 අනාථරීක ගනුදෙනු

විගණන නිරීක්ෂණය	කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම	නිර්දේශය
තේ ශක්ති අරමුදලේ යටිනුවර, පොතුපිටිය හා බුලත්කොහුපිටිය කම්හල් ඉදිකිරීම සඳහා පුද්ගලික ආයතනයක් වෙත 2001 වර්ෂයේදී රු.28,311,751 ක අත්තිකාරම් මුදලක් ලබාදී වර්ෂ 15 කට වැඩි කාලයක් ගත වී තිබුණද එම කාර්යය අවසන්කර නොතිබුණු අතර ලබා දුන් අත්තිකාරම් නිරවුල් කර ගැනීමට හෝ ප්‍රමාණවත් ප්‍රතිපාදන සැලසීමට කටයුතු නොකර මූල්‍ය ප්‍රකාශන තුළ ජංගම වත්කම් යටතේ ගිණුම්ගතකර තිබුණි.	ඇතැම් කර්මාන්තශාලාවල කොටසක් ඉදිකර ඇති අතර, එවකට තේ ශක්ති අරමුදල සඳහා රජය යටතේ ලබාදීමට එකඟවූ නියමිත මුදල් නොලැබීම මත එම ව්‍යාපෘති සම්පූර්ණ කිරීමට නොහැකි වී ඇති අතර මේ පිළිබඳව තවදුරටත් අධ්‍යයනය කොට තීරණය කිරීමට නියමිතව ඇත.	ලබා දුන් අත්තිකාරම් නිරවුල් කර ගැනීමට හෝ භෞතික ප්‍රගතිය සමාලෝචනය කර එහි කාර්යක්ෂමතාවය පිළිබඳව ඉදිරියේදී පියවර ගත යුතුය.

3.2 කළමනාකරණ අකායර්ක්ෂමතා

	විගණන නිරීක්ෂණය	කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම	නිර්දේශය
(අ)	අරමුදල ප්‍රතිව්‍යුහගත කිරීමට අදාළ 2016 ජූලි 13 දිනැති අංක අමප /16 /1224 /726 /015 – I දරන අමාත්‍ය මණ්ඩල තීරණය සඳහා මුදල් අමාත්‍යවරයාගේ නිරීක්ෂණවල දක්වා ඇති පරිදි ප්‍රධාන කාර්යාලයේ ස්ථිර කාර්යය මණ්ඩලය, කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුවේ එකඟතාවය මත අමාත්‍යාංශය යටතේ පවතින වෙනත් ආයතනවල පවත්නා පුරප්පාඩු සඳහා අනුයුක්ත කිරීම සහ පුරප්පාඩු නොපවතිනම් අධි සේවක පදනම මත ඔවුන් වෙත විශේෂ වන සේ එම ආයතන සඳහා අනුයුක්ත කළ යුතු වුවද, රාජ්‍ය ආයතන 06 ක් වෙත අනුයුක්ත කර තිබුණු තේ ශක්ති සේවකයන් 17 දෙනෙකු වෙනුවෙන් වැටුප් වශයෙන් රු. 6,936,224 ක් අමාත්‍ය මණ්ඩල තීරණයෙන් පසුවද අරමුදල විසින් ගෙවා තිබුණි.	නිරීක්ෂණය සමඟ එකඟ වේ.	අමාත්‍ය මණ්ඩල තීරණය ප්‍රකාරව කටයුතු කළ යුතු අතර, ගෙවන ලද මුදල් ආපසු අයකර ගත යුතුය.
(ආ)	තේ ශක්ති අරමුදලට එරෙහිව බාහිර පාර්ශවයක් විසින් දිසා අධිකරණයේ එක් නඩුවක් ගොනුකර තිබුණු අතර තේ ශක්ති අරමුදල විසින් දිසා අධිකරණවල නඩු 06 ක් හා ඉඩම් නඩු දෙකක් ද, අභියාචනාධිකරණයේ නඩු දෙකක්ද ගොනුකර තිබුණි.	තේ ශක්ති අරමුදට අයත් ඉඩම් බාහිර පාර්ශවයන් විසින් භුක්ති විඳීමට එරෙහිව තේ ශක්ති අරමුදල විසින් ඔවුනට විරුද්ධව නඩු පවරා ඇත.	පවත්නා නඩු කටයුතු නොපමාව විසඳා ගැනීම කළ යුතුය.
(ඇ)	2002 / 2003 තක්සේරු වර්ෂයට අදාළව ගෙවියයුතු රු.4,545,276 ක රඳවා ගැනීම් බදු සමාලෝචිත වර්ෂය	මේ සම්බන්ධව දේශීය ආදායම් දෙපාර්තමේන්තුවේ කරුණු විමසා ඉදිරි කටයුතු	දේශීය ආදායම් දෙපාර්තමේන්තු එකඟතාවය මත හිඟ හිටි

	අවසාන වන විටත් ගෙවීම් කිරීමට හෝ නිසි පරිදි නිරවුල් කිරීමට කටයුතු කර නොතිබුණි.	සිදු කිරීමට අවශ්‍ය කටයුතු සිදු කරමින් පවතී.	රඳවාගැනීමේ බදු නිරවුල් කිරීමට පියවර ගත යුතුය.
(ඈ)	අරමුදල විසින් ක්‍රියාත්මක කරන හොරණ පොහොර ගබඩාව හා රයිගම් කෝරලය කම්හල පිහිටි ඉඩම්වල අයිතිය , දැනට අදාළ ප්‍රාදේශීය ලේකම් යටතේද ඇල්පිටිය, හිනිදුම, හා පස්සර යන කම්හල් පිහිටි ඉඩම්වල අයිතිය ඉඩම් ප්‍රතිසංස්කරණ කොමිෂන් සභාව යටතේද පවතින නමුත් ඉඩම්වල අයිතිය නීත්‍යානුකූලව අරමුදලට පවරා ගැනීමකින් තොරව වටිනාකම රු. 81,036,209 ක ගොඩනැගිලි ඉදිකර තිබුණි.	මේ වනවිට එම ඉඩම් තේ ශක්ති අරමුදල වෙත නීත්‍යානුකූලව පවරා ගැනීම සඳහා අදාල ආයතනය සමඟ සාකච්ඡා කර අවශ්‍ය ඉදිරි කටයුතු සිදු කරමින් පවතී.	ඉඩම් අයිතිය පවරාගැනීමට කටයුතු කළ යුතුය.
(ඉ)	වාහන අපහරණය කිරීමෙන් ලැබෙන මුදල් ඒකාබද්ධ අරමුදලට බැර කලයුතු වුවත් අරමුදල සතු වාහන 4ක් අපහරණය කිරීමෙන් ලැබුණු රු.4,771,822 ක් වැවිලි කර්මාන්ත අමාත්‍යාංශයේ ලේකම් වෙනුවට ප්‍රධාන ගණකාධිකාරීගේ 2016 ජූලි මස අංක MPI/ACC/F14/T5F දරන ලිපිය ප්‍රකාරව තේ ශක්ති අරමුදල විසින් පොල් වගා කිරීමේ මණ්ඩලයෙන් ලබා ගෙන තිබූ ණය මුදලක් පියවීම සඳහා භාවිතා කර තිබුණි.	තේ ශක්ති අරමුදල 2000 අංක 47 දරන තේ ශක්ති අරමුදල් පනත මඟින් පිහිටුවා ඇති අර්ධ රාජ්‍ය ආයතනයක් බැවින්, ආයතනයේ ස්ථාවර වත්කම් විකිණීමේ බලය හා ආදායම් භාවිතා කිරීමේ බලය එහි අධ්‍යක්ෂ මණ්ඩලයට හිමිව ඇත. ඒ අනුව, කටයුතු කර ඇති අතර, අදාල සිදුවීම තේ ශක්ති අරමුදල ප්‍රතිව්‍යුහගත කිරීමට ප්‍රථම සිදු වූ ගණුදෙනුවකි.	රාජ්‍ය මුදල් චක්‍රලේඛ ප්‍රකාරව වත්කම් අපහරණය කිරීමෙන් ලැබෙන සියලුම ආදායම් ඒකාබද්ධ අරමුදලට බැර කළයුතුය.

3.3 මෙහෙයුම් අකාර්යක්ෂමතා

	විගණන නිරීක්ෂණය	කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම	නිර්දේශය
(අ)	2016 ජූලි 13 දිනැති අංක අමප 16/1224/726/015-I සහ 2016 අගෝස්තු 17 දිනැති අංක අමප/16/1427/726/015-II දරන අමාත්‍ය මණ්ඩල තීරණ මඟින් තේ ශක්ති අරමුදලේ කටයුතු වැවිලි කර්මාන්ත අමාත්‍යාංශයේ ලේකම්වරයා වෙත පවරා අරමුදල ප්‍රතිව්‍යුහගත කිරීමට තීරණය කිරීමෙන් පසුව දෙනියාය, ගිලීමලේ, රයිගම් කෝරලේ සහ දැරණියගල යන තේ කර්මාන්තශාලා බදු පදනමට බාහිර පාර්ශවයන්ට ලබා දී තිබුණි. එම එළඹ තිබුණු බදු ගිවිසුම්වල 07 වන වගන්තියේ සඳහන් පරිදි දේපල බදු ලබාගත් පාර්ශවයන් විසින් මාසික අමු දලු ධාරිතාවට සරිලන වටිනාකමට තේ	මාසික දළු මිළ වෙනස්වීම මත අදාල වටිනාකම වෙනස්වීම හා කර්මාන්තශාලා ආරම්භ කිරීමේදී විශාල මූලික ප්‍රාග්ධනයක් යෙදීමට සිදුවීම වැනි කරුණු මත අදාල කොන්දේසිය ඉටු කිරීමේ ප්‍රායෝගික ගැටළු ඇතිවී ඇත. කෙසේ වෙතත් ඉදිරියේදී අත්සන් කරුණු ලබන ගිවිසුම්වල කොන්දේසි ඇතුලත් කිරීම සම්බන්ධව තවදුරටත් සමාලෝචනය කර ඉදිරි කටයුතු සිදු කිරීමට නියමිතව ඇත.	බදුකරුවන්ගෙන් බැංකු ඇපකර හෝ රක්ෂණාවරණ ලබා ගැනීමට ගිවිසුම් ප්‍රකාරව කටයුතු කළ යුතුය.

	ශක්ති අරමුදල නමින් බැංකු ඇපකර හෝ රක්ෂණාවරණ ලබාගත යුතු නමුත් අරමුදල සමාලෝචිත වර්ෂය අවසන් දින වන විටද බදුකරුවන්ගෙන් බැංකු ඇපකර හෝ රක්ෂණාවරණ ලබාගෙන නොතිබුණි.		
(ආ)	තේ ශක්ති අරමුදල සතු වූ හිණිදූම තේ කර්මාන්තශාලාවේ කළමනාකරණය කළුබෝවිටියාන තේ කර්මාන්තශාලාව වෙත ලබාදීමේදී කර්මාන්තාශාලා ලාභයෙන් 1/3 ක් තේ ශක්ති අරමුදලට ලබාදීමට එකඟ වී තිබුණද, කර්මාන්තශාලාවේ අලාභ තත්වය මත එම කොටස තේ ශක්ති අරමුදලට ලබාදී නොතිබුණද අරමුදලට අයත් ස්ථාවර වත්කම්වල ක්ෂය වටිනාකමට සමාන මුදලක් එනම් රු.1,661,828ක් වෙළඳ ලැබිය යුතු දැ ලෙස 2015 වර්ෂයේ සිට ගිණුම්වල දක්වා තිබුණි.	හිනිදූම කර්මාන්තශාලාව අලාභ තත්ත්වයෙන් පැවැති බැවින්, 1/3 ලාභ කොටස තේ ශක්ති අරමුදලට කළුබෝවිටියාන තේ කර්මාන්තශාලා සමාගමෙන් ගෙවා නොමැති අතර, අදාල කාල පරිච්ඡේදයට අයත් තේ ශක්ති අරමුදලට අයත් ස්ථාවර වත්කම්වල ක්‍ෂයවීම වටිනාකමට ලැබිය යුතු දැ ලෙස දක්වා ඇත.	2019 මාර්තු 19 දිනැති අංක අමප/19/0743/117/024 දරන අමාත්‍ය මණ්ඩල තීරණය ප්‍රකාරව හිනිදූම තේ කර්මාන්තශාලා අයිතිය නීත්‍යානුකූලව කළුබෝවිටියාන තේ කර්මාන්තශාලාව වෙත පවරාගැනීමට අනුමැතිය ලැබී ඇති බැවින් වෙළඳ ලැබිය යුතු දැ ලෙස ගිණුම් වල දක්වා ඇති වටිනාකම පිළිබඳව ප්‍රායෝගික තත්වය පිළිබඳ අවධානය යොමුකළ යුතුය.